# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2465/14 - 2025 දෙසැම්බර් මස 03 වැනි බදාදා - 2025.12.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: WGSWD&EIP/ACQ/KB/50.
*කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය*: 4/3/10/2020/LRB/195.

වේරැස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, 120 බස් මාර්ගයේ සිට අංක 394/4, කොළඹ පාර, පැපිලියාන ලිපිනයේ පිහිටි U.S.S. සර්විස් (පුද්.) සමාගම පිහිටි ඉඩම් කොටස දක්වා ඇළ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඉඩම් කොටස් රජය වෙත අත්කර ගැනීම සඳහා ඉඩම් කොටස් රජයට පවරාගෙන ඇති බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*පවරා ගන්නා ලද ඉඩම් විස්තරය* :-

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 535සී පැපිලියාන නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කර ඇති අංක 521212 හා 2025.11.21 දිනැති කැඩැස්තර සිතියමේ කලාප 02, පත්‍ර අංක 05 හි කැබලි අංක 02, 03, 05, 06, 08, 10 හා 12 වශයෙන් දැක්වෙන බිම් කොටස්.

**01. කැබලි අංක 02**
ඉඩමේ නම: මීගහවත්ත, මිදෙල්ලගහකුඹුර, හික්ගහකුඹුර *නොහොත්* බුලුගහකුඹුර, මිදෙල්ලගහකුඹුර *නොහොත්* දිවිගහමුල්ලකුඹුර කදුරුගහකුඹුර සහ වැඩවසම් මාදම්ගහකුඹුර නොහොත් පේදුරුවකුඹුර වරිපනම් අංකය 408, 410 සහ 412 කොළඹ පාර; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: යුරෝ ස්කෑන් එක්ස්පෝර්ට් පුද්ගලික සමාගම; ප්‍රමාණය: හෙක්. 0.0171.

**02. කැබලි අංක 03**
ඉඩමේ නම: -; විස්තරය: ගෙවත්ත, පැරණි ඇළෙහි කොටසක්; හිමිකම් කියන්නා: සොයාගත නොහැක; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0025.

**03. කැබලි අංක 05**
ඉඩමේ නම: -; විස්තරය: ගෙවත්ත, පැරණි ඇළෙහි කොටසක්; හිමිකම් කියන්නා: සොයාගත නොහැක; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0010.

**04. කැබලි අංක 06**
ඉඩමේ නම: මීගහවත්ත, වරිපනම් අංකය - 408ඒ, කොළඹ පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සුජාතා ශ්‍රියානි ගුණරත්න, අනුරංග සජිත් ගුණරත්න, නිලුප රවීන් ගුණරත්න, හේවාදේවගේ නිමල් ජයසිරි ගුණරත්න සහ හේවාදේවගේ සුනිල් ගුණරත්න; ප්‍රමාණය: හෙක්. 0.0069.

**05. කැබලි අංක 08**
ඉඩමේ නම: සොයාගත නොහැක; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: -; ප්‍රමාණය: හෙක්. 0.0011.

06. **කැබලි අංක 10**
ඉඩමේ නම: කහටගහඹිවිට *නොහොත්* හික්ගහඹිවිට; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: -; ප්‍රමාණය: හෙක්. 0.0010.

07. **කැබලි අංක 12**
ඉඩමේ නම: හික්ගහඹිවිට, වරිපනම් අංක 406/සී, සුනේත්‍රා දේවි පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: මුහන්දිරම්ලැ ගෙදර සාහුල් හමීඩ් මොහොමඩ් නසාර් මයා; ප්‍රමාණය: හෙක්. 0.0068.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.01.13 වැනි දින පෙ.ව. 9.00 ට රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026.01.06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එච්. තිලකවර්ධන,**
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි, වේරැස් ගඟ
වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ
ව්‍යාපෘතිය, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2025 දෙසැම්බර් මස 02 වැනි දින,
වේරැස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

EOG 12 - 0014